 ISSN 2362-0412

# සිංහල ළමා කාව්‍ය සාහිත්‍යයෙහි සම්භවනය පිළිබඳ අධ්‍යයනයක්

ජයන්ත අමරසිංහ

*සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

**සංක්ෂේපය**

ළමයින් අරමුණු කර ගත් සාහිත්‍යයක් විසි වැනි සියවසේ මුල් භාගය වන තෙක් සිංහල භාෂාවෙන් රචනා වූ බවට සාක්ෂ්‍ය හමු නොවන අතර අනුරාධපුර රාජධානි සමයේ සිට සිංහල භාෂාවට සහ සාහිත්‍යයට බලපෑ පාලි, සංස්කෘත සාහිත්‍යයෙහි ද සම්බන්දයක් පැවැති බවට සාක්ෂ්‍ය විද්‍යාමාන නො වේ. පොදුවේ ගත් කල ආසියාතික සාහිත්‍යයෙහි ද විසි වැනි සියවසේ උදාව තෙක් ළමා සාහිත්‍යයක් පැවැති බවට සාක්ෂ්‍ය නැත. ක්‍රි.ව. 16 වැනි සියවසෙහි පමණ සිට බටහිර සහ යුරෝපා රටවල තහවුරු වූ සාහිත්‍ය උරුමය අද දක්වා අඛණ්ඩ ව පැවැත එයි. ඊට අමතර ව එම රටවල දීර්ඝ කාලයක සිට මුඛ පරම්පරාගත ව පැවැත එන සුරංගනා කථා සාහිත්‍යයක් පැවැතීම ද විශේෂත්වයකි. ප්‍රංශ විප්ලවයෙන් පසු ආසන්න වකවානුවක නිදහස් පුද්ගලයාගේ බිහි වීමත් සමග එකී පුද්ගලයාගේ ජීවිතයේ ළමා කාලය ශික්ෂණය කිරීමේ මාර්ගයක් ලෙස ළමා සාහිත්‍යය බිහි විය. ලංකාව ඇතුළු ආසියාතික රටවල ළමා සාහිත්‍යයක ව්‍යාප්තිය ඇරඹෙන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයේ ග්‍රහණයට එම රටවල් නතු වීමෙහි ප්‍රතිඵලයක් වශයෙනි. සාම්ප්‍රදායික සමාජ ආර්ථික ව්‍යූහ මත ධනවාදය උපරි ආරෝපණය කිරීම හේතුවෙන් නව ජීවන තත්වයන්ට හැඩගැසීම, ඉංග්‍රීසි අධ්‍යාපනයේ ව්‍යාප්තිය සමග බැඳුණු ඉංග්‍රීසි සාහිත්‍යයේ බලපෑම, පෙරදිග වැසියන්ගේ මනස යටත්විජිත අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි හැඩගැස්වීම යන ලක්ෂණ සහ අරමුණු පෙරදිග අලුතින් ව්‍යාප්ත වූ ළමා සාහිත්‍යයේ මෙන් ම ලාංකේය ළමා සාහිත්‍යයෙහි ද අන්තර්ගත විය. ලංකාවේ ළමා සාහිත්‍යය ආරම්භ වන්නේ කොළඹ කවියේ ප්‍රථම තරංගය නියෝජනය කළ කවි පරපුරෙනි. වෙනම ගුරුකුලයක් ලෙස සංවිධානය වුවත් හෙළ හවුල ද කාලය අතින් සමාන්තර වන්නේ කොළඹ කවියේ ප්‍රථම තරංගයට ය. මෙකී කවීන්ගෙන් කිහිප දෙනෙකු සිංහල ළමා කවියෙහි සමාරම්භක වකවානුව ප්‍රභාමත් කළ බව ප්‍රකට ය. සිංහල සාහිත්‍යයෙහි කලින් නො පැවති නව සාහිත්‍යාංග යක් මේ කවි පරපුර වෙතින් නිර්මාණය වීමෙහි ලා ධනවාදයේ උපරි ආරෝපණය හැරුණු විට බලපෑ වෙනත් සාධක කෙරෙහි විචාරක අවධානය සැලකිය යුතු අන්දමින් මේ දක්වා යොමු වී නැත. කොළඹ කවියෙහි ප්‍රථම තරංගය සහ හෙළ හවුල නියෝජනය කළ කවීහු ස්වකීය කවිත්වය ජාතික ව්‍යාපාරයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට යෙද වූහ. ඔවුන් පැතූ නිදහස භුක්ති විඳිනු ඇතැ යි විශ්වාස කළ අනාගත පරපුරෙහි රස මනස පෝෂණය ද මේ කවීන්ගේ එක් පැතුමක් වන්නට ඇත. එමෙන් ම මොවුන් තුළ පැවැති නිර්මාණාත්මක පරිකල්පනය ලිය ලා වැඩෙන්නට තිබූ එක ම නිදහස් අඩවිය ළමා ලෝකයේ අදූෂිත කාල්පනික රජ දහන වන්නට ඇත. එවන් අනුමානයක් යුක්ති සහගත කිරීමෙහි ලා අප හමුවේ ඇති ප්‍රබල ම සාක්ෂ්‍ය වන්නේ කොළඹ කවියේ ප්‍රථම තරංගයෙන් පසු සියලු හිතකර තතු වර්ධනය වී තිබියදීත් තත්කාලීන ළමා සාහිත්‍යය අභිභවනය කිරීමට කිසිදු සිංහල කවියකුට නොහැකි වීම යි. ළමා සාහිත්‍යයෙහි සහ ළමා කාව්‍ය සාහිත්‍යයෙහි සම්භවනය කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපෑ තීරණාත්මක ම සාධකය වනුයේ උත්තරාරෝපිත ධනවාදය බව මෙම අධ්‍යයනයේ මූලික නිගමනය වුවත් ඉන් පරිබාහිර කරුණු ද ළමා කාව්‍යයෙහි සම්භවනය සඳහා පිටුබල සැපයී ය. ප්‍රධාන වශයෙන් ම ජාතික ව්‍යාපාරයේ ක්‍රියාධරයන් ලෙස ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළ සාහිත්‍යකරුවන් ළමා හද මනසෙහි ජාතික හැඟීම් ජනනය කිරීමේ ක්‍රමෝපායක් ලෙස ළමා කාව්‍ය රචනා කිරීම ආරම්භ කළ බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ළමා සාහිත්‍යය, සිංහල ළමා කාව්‍ය, ධනවාදයේ උපරි ආරෝපණය, කොළඹ කවියේ ප්‍රථම තරංගය, හෙළ හවුල